**මධ්‍යම පළාත් සභාවේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කළමණාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ 2**
**භෛසජ්ජක තනතුරේ iii ශ්‍රේණිය සඳහා**
**විවෘත පදනම මත තෝරා ගැනීමට අදාල අයදුම්පත් කැඳවීම.**

මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කළමණාකරණ සහකාර තාක්ෂණ ඛණ්ඩ 2 (MT 02 -2025) භෛසජ්ජක තනතුරේ III ශ්‍රේණිය සඳහා විවෘත පදනම මත පත් කර ගැනීමට සුදුසුකම් ලත් අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.අයදුම්පත් කැඳවීමේ අවසන් දිනය 2026.10.02 වේ.

02. මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2019.09.04 දිනැතිව අනුමත කරන ලද මධ්‍යම පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කළමණාකරණ සහාකාර තාක්ෂණ ඛණ්ඩය 2 සේවා ගණයේ භෛසජ්ජක තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ 7.2.2 හි විධිවිධාන අනුව 2026.01.27 දිනට වසය අවුරුදු 18 ත් 35ත් අතර පහත සුදුසුකම් සම්පූර්ණ කර ඇති අපේක්ෂකයින් හට මේ සඳහා අයදුම් කල හැකිය.

03. තනතරු 02 ක් සදහා අයදුම්පත් කැඳවන අතර මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත වේ. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 10/2025 අනුව මෙම තනතුරට අදාල වැටුප් කේතය හා පරිමාණය -
MT2-2025 සහ 50630 – 10 X 630 – 11 X 670 -10 X 1010 – 10 X 1190 – 86300 වේ.

(i) අධ්‍යාපන සුදුසුකම් - ගණිතය, සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, විද්‍යාව යන විෂයන් ඇතුලුව විෂයන් හතරක් (04) සම්මාන සහිතව එක් වරකදී විෂයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගය සමත්ව තිබීම.

සහ

අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙල විභාගයේදී විද්‍යා විෂය ධාරාවෙන් සියලුම විෂයන්ගෙන් (සාමාන්‍ය පොදු පරික්ෂණය හැර) සමත් වී තිබීම.තෘතියක අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබාතිබීම.

(ii) වෘත්තිය සුදුසුකම්- විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයකින් දෑ අවුරුදු භෛසජ්ජක පාඨමාලාව හදාරා සහතිකපත් ලැබ භෛසජ්ජකවරයකු ලෙස ආයුර්වේද වෛද්‍ය සභාවේ ලියාපදිංචි වි තිබිය යුතුය.

(iii) පළපුරුද්ද - අදාල නොවේ.

(iv) කායික සුදුසුකම් - සෑම අපේක්ෂකයෙකුම මධ්‍යම පළාත තුළ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරිරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

(v) වෙනත් -

i. ශ්‍රී ලංකාවේ පුරවැසියකු විය යුතුය.

ii. අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

iii. මධ්‍යම පළාත තුල පූර්වාසන්න වසර 03 ක ස්ථිර පදිංචිය තහවුරු කල යුතුය.(පදිංචි සහතිකයක් මගින්)

iv. තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් , එම සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ /ගැසට් පත්‍රයේ සඳහන් කරනු ලබන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතුය.

Gazette.lk

03. බඳවා ගැනීමේ ක්‍රමය - (i) වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් ලබාගන්නා ලකුණු වල කුසලතා අනුපිළිවල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට බඳවාගනු ලැබේ.

(ii) වෘත්තීය පරීක්ෂණය - ආයුර්වේද ඖෂධ නිෂ්පාදනය, ගබඩා කිරීම සහ නිකුත් කිරීම සඳහා ඖෂධ වර්ග ලබාගැනීම, අදාල උපකරණ ලබාගැනීම හා බෙදාහැරීම, ගණන් තැබීම යන විෂයන්ගෙන් සමන්විත වේ.

(iii) අයදුම්පත් කැඳවීමේ ක්‍රමය - දැන්වීමේ පල කර ඇති අයදුම්පතේ ආකෘතියට අනුව සකස් කරගත් අයදුම්පතක් සම්පූර්ණ කර 2026.10.02 දින හෝ එදිනට පෙර ලේකම්, තැ.පෙ 121, මධ්‍යම පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශය, සංඝරාජ මාවත මහනුවර ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැලෙන් යොමුකල යුතුය. අයදුම්පත බහාලන කවරයේ වම්පස ඉහල කෙලවරේ "මධ්‍යම පළාත් සභාවේ ආයුර්වේද දෙපාර්තමේන්තුවේ කළමණාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ 2 හෛසජ්ජක තනතුර සඳහා විවෘත පදනම මත තෝරා ගැනීමට අදාල අයදුම්පත් කැඳවීම" ලෙස සඳහන් කල යුතුය.

දිනය 2026.09.11

ජගත් අධිකාරි
ලේකම්
සෞඛ්‍ය දේශීය වෛද්‍ය සමාජ සුභසාධන
පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය
මධ්‍යම පළාත

SINCE 2014
Gazette.lk
AMBITIONS REALIZED